
# ශ්‍රී ලංකාවේ විසංමුතිය මර්දනය

2014 නොවැම්බර්



විනාශ කරන ලද විපක්ෂයේ කාර්යාලයක් - නොවැම්බර් මාසය දේශපාලන විපක්ෂයට එල්ලවීමට නියමිත වූ ප්‍රහාර මාලාවක ආරම්භය සටහන් කළේය ( ඡායාරූපය: කැෆේ)


INFORM
Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

A. රජයට විරුද්ධ බව පෙනෙන පුද්ගලයන්ව ඝාතනය කිරීම, පැහැර ගෙනයාම සහ බිය ගැන්වීම

B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම

C. දෙමළ සිහි කිරීම් වලට බාධා සහ තර්ජන

D. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

E. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව,ජාතිකව සහ ජාතයන්තරව වාර්තා කිරීමටත්ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේදී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කරතිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය:

ජනාධිපති ධූර කාලය අවසන් වීමට වසර දෙකකට ආසන්න කාලයක් තිබියදී මාසයක පමණ අනුමානයන්ගෙන් පසු 2015 ජනවාරි 8 වන දින ජනාධිපතිවරණය පැවැත්වෙන බව නිල වශයෙන් ප්‍රකාශයට පත් විය. පක්ෂයේ ප්‍රබල සාමාජිකයෙකු සහ රාජපක්ෂ ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් වරයාව විපක්ෂ දේශපාලන පක්ෂ වලින් සැදුම් ලත් පොදු විපක්ෂයේ ජනාධිපතිවරණ පොදු අපේක්ෂකයා වශයෙන් තෝරා ගන්නා ලදී. විපක්ෂ දේශපාලන පක්ෂ සහ ඔවුන්ගේ ආධාරකරුවන් මර්දනය කිරීම එසැනින්ම ආරම්භ විය. සිය පක්ෂය, පාලක සහාග ආණ්ඩුවේ අමාත්‍ය පදවි ඉල්ලා අස් වන බව ප්‍රකාශ කර දින කිහිපයකින්, විරසක වූ මැර කණ්ඩායමක් විසින් ජාතික හෙල උරුමයේ නායක අතුරලියේ රතන හිමියන්ගේ පන්සල වට කරන ලදී. ආරක්ෂක රථ පෙළකට එල්ල වූ ප්‍රහාරයක් අවස්ථාවේදී ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ හිසට වෙඩි තබන ලදී. ජනාධිපති සහෝදරයන් වන ආරක්ෂ අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂගේ අණ යටතේ ඍජුව පාලනය වන බුද්ධි අංශ සහ පොලිස් නිලධාරීන් විසින් උතුරු නැගෙනහිර සිවිල් සංවිධාන වල බිම් මට්ටමේ දෙමළ සාමාජිකයන් පාලක පක්ෂයේ පැත්තට නම්මවා ගැනීමට උත්සහ කරන බව පුවත්පත් වාර්තා කළේය. රැදවුම් භාරයේ සිටින සිය පුත්‍රයා නිදහස් කර ගැනීමට අවශ්‍ය නම් පාලක පක්ෂය වෙත මාරු වන ලෙස එක් නගර සභා සමාජිකයෙකුට පවසා ඇත. උතුරේ මෙන්ම දිවයිනේ සෙසු ප්‍රදේශ වලදී ද  අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තර්ජනයට ලක්විය. නොවැම්බර් 22 වන දින ජනාධිපතිවරණ පොදු අපේක්ෂකයාගේ ප්‍රථම රූපවාහිනී සාකච්ඡාව රූපවාහිනී සේවා සපයන පෞද්ගලික ආයතනයක් මගින් අවහිර කරන දී. පවතින රජය සහ ජනාධිපතිවරයාව දැඩිව විවේචනය කරන ජනතා විමුක්ති පෙරමුණ සඳහා ඉඩ ලබා නොදෙන ලෙස බුද්ධි අංශ නිලධාරීන් විසින් යාපනය පුවත්පත් සංසදය  වෙත තර්ජනය කළේය. යුධ හමුදාව විසින් උතුරේ දෙමල ජනමාධ්‍යවේදීන්ව බියගැන්වීම් වලට සහ ප්‍රශ්ණ කිරීම් වලට ලක් කරන බවට සහ  යාපනයේදී පැවැත්වීමට නියමිතව තිබූ පුහුණු වැඩමුළුවක් අවලංගු කිරීමට බල කළ බවට දෙමල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් චෝදනා කළේය. කොමියුනිස්ට් පක්ෂය විසින් ප්‍රකාශයට පත් කරන ඇත්ත පුවත්පත් කාර්යාලය පක්ෂයේ ඉහල නියෝගයක් අනුව නොවැම්බර් 7 වන දින සීල් තැබුණු අතර පුවත් පත බෙදා හැරීම නවත්වන ලදී.

පැහැරගෙන ගොස් අතුරුදහන් කර ඇති මධුෂ්ක හැරිස් ද සිල්වා මහතාගේ බිරිඳ වන මයුරි ඉනෝකා ජයසිංහ මෙනෙවිය නොවැම්බර් 1 වන දින අනුරාධපුර නගරයේදී කිසියම් පිරිසක් විසින් පැහැරගෙන යන ලදී. ඇය සිය සැමියාගේ අතුරුදහන් වීම පිළිබඳ යුක්තිය සහ

සාධාරණය ඉල්ලා සටන් කරන්නියකි. පසුගිය මාස කිහිපය තුළ අවස්ථා කිහිපයකදීම තර්ජන වලට ලක් වී ඇත. අධ්‍යාපනය පෞද්ගලීකරණයට විරුද්ධව අත්සන් එකතු කරමින් සිටි අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යබල මණ්ඩලයේ ශිෂ්‍යයින්ට නාමල් රාජපක්ෂ විසින් මෙහෙයවනු ලබන නිල් බලකාය විසින් පහර දෙන ලදී.

පෙර වසර වලදී මෙන්ම දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ දිනය හෙවත් මහා වීර දිනය (නොවැම්බර් 27) සහ එල්.ටී.ටී.ඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ජන්ම දිනය (නොවැම්බර් 26) දක්වා දක්වා කාලය තුළ උතුරේ සහ නැගෙනහිර ආරක්ෂ අංශ විසින් දෙමල ජනතාව දැඩි පාලනයකට ලක් කරන ලදී. නොවැම්බර් 3 වන දින යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපති සහ ශිෂ්‍ය ක්‍රියාකාරීන් සිවු දෙනෙකු වෙත මරණ තර්ජන සහිත පොස්ටර් විශ්ව විද්‍යාල භූමියට නුදුරු ස්ථානයක අලවා තිබිණි. නොවැම්බර් 27 වන දිනට යෙදී තිබුණි මහා වීර දිනය සැමරීම සඳහා වන ඕනෑම වැඩසටහනක් නවත්වා දැරීම මූලික අරමුණ කර ගත් නව 'නිරීක්ෂණ මධ්‍යස්ථාන' දෙකක් යාපනය විශ්ව විද්‍යාලය අසල ආරම්භ කර ඇති බව වාර්තා විය. ආරක්ෂ හමුදාවන් ඉදිරියට පැමිණ විශ්ව විද්‍යාල ප්‍රජාව වෙත එල්ල කරන ලද බල කිරීම් වලින් පසුව යාපනය විශ්ව විද්‍යාලය නොවැම්බර් 26 වන දින සිට දෙසැම්බර් 1 වන දින දක්වා නිල වශයෙන් වසා තැබිණි. විශ්ව විද්‍යාලයේ ප්‍රධාන ගේට්ටු දෙකෙහි පාලනය සියතට ගත් ආයුධ රැගත් ආරක්ෂක හමුදා නිලධාරීන් සිය ගනණනක් විසින් ශිෂ්‍යයන්ට නේවාසිකාගාර ඇතුළු විශ්ව විද්‍යාල භූමියෙන් ඉවත් වන ලෙසට අණ කළ බව වාර්තා විය. නොවැම්බර් 27 වන දින විශ්ව විද්‍යාල භූමියේ රැඳී සිටි ශිෂ්‍යයන් සහ ආචාර්යවරුන් පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස පොලිස් ත්‍රස්ත විමර්ශන අංශය විසින් විශ්ව විද්‍යාල ආරක්ෂක නිලධාරීන්ට අණ දුන් බව වාර්තා විය. මහාවීර දිනය වෙනුවෙන් වැඩ කරන ශිෂ්‍යයන් හඳුනා ගැනීම සඳහා ත්‍රස්ත විමර්ශණ අංශයට සහයෝගය ලබා දෙන ලෙස විශ්ව විද්‍යාල පරිපාලනය වෙත ද දැනුම් දී තිබුණි. එදිනම විශ්ව විද්‍යාල භූමිය තුළ ඇති විනාශ වී ගිය විරයන්ගේ සැමරුම් ස්මාරකය ඉදිරිපිට ආරක්ෂක හමුදාවන් යොදවා තිබුණු අතර අවට ප්‍රදේශයන්වල පරීක්ෂා කිරීම් සහ ආරක්ෂාව තර කර තිබුණි.

කොටි නායක ප්‍රභාකරන්ගේ ජන්ම දිනය සැමරුවේ යැයි චෝදනා කරමින් බුද්ධි අංශ නිලධාරීන් විසින් උතුරේ ප්‍රධාන පෙළේ පුවත් පතක් වන උදයන් පුවත් පත පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කිරීමට සූදානම් වන බව වාර්තා විය. මහා වීර දිනය සඳහා මුද්‍රණය කළ පෝස්ටර් ලග තබා ගත්තැයි යන චෝදනාව මත තරුණ දෙමළ ක්‍රියාකාරිකයෙකුගෙන් පොලිස් ත්‍රස්ත විමර්ශන අංශය විසින් ප්‍රශ්න කරන ලදී. නොවැම්බර් 25 වන දින රාත්‍රියේ සොල්දාදුවන් විසින් ඔහුව අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා විය. නොවැම්බර් 26 වන දින

සවස් වරුවේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් විසින් දෙමල ජනතා ජාතික පෙරමුණෙහි කාර්යාලය වට කර එහි දොරටුව අසල බුද්ධි අංශ නිලධාරීන් රඳවා තිබුණි. නොවැම්බර් 25 වන දින ත්‍රිකුණාමලය බටහිර මුතූර්හි මුන්නම්පොජ්ඩවෙඩෙහි පිහිටි පිල්ලෙයාර් හින්දු කෝවිල වෙත පූජාවක් සඳහා පැමිණි බැතිමතුව බුද්ධි අංශ නිලධාරීන් විසින් පළවා හැර ඇත්තේ ඔවුන් මිය ගිය කොටි වීරයන් වෙනුවෙන් පූජා පැවැත්වීමට පැමිණ ඇති බව පවසමිනි. හමුදාව විසින් පූජාවන් සඳහා යොදා ගන්නා පොංගල් කිරිබත් පිසීමට බැතිමතුන් විසින් සකස් කරගෙන තිබුණු මුට්ටිය බිඳ දමා ඇත.

නොවැම්බර් 12 වන දින රාත්‍රියේදී නාඳුනන තුවක්කරුවෙකු විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ වෙල්ලන්කුලම් ප්‍රදේශයේදී පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කරන ලදී. මෙසේ මරා දමා ඇත්තේ නගුලේශ්වරන් ක්‍රිෂ්ණසාමි නැමතා 34 හැවිරිදි පුද්ගලයෙකි. මොහු ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ පරීක්ෂණය සඳහා තොරතුරු ලබා දීමට දෙමළ ජනතාව ධෛර්යමත් කළ පුද්ගලයෙකු බව වාර්තා විය. ප්‍රදේශයේ පුනුරුත්තාපනය නොලැබූ එල්.ටී.ටී.ඊ සාමාජිකයන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා බුද්ධි අංශ නිලධාරීන් හමු වීම මොහු විසින් ප්‍රතික්ෂේප කිරීම මෙම ඝාතනයට තවත් හේතුවක් ලෙස ජනමාධ්‍ය පෙන්වා දුන්නේය.

ඇතැම් සිදුවීම් පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර ඇති බව පොලීසිය පැවසුවත් සැබෑ ප්‍රගතියක් පිළිබඳ කිසිදු වාර්තාවක් නොමැත. දඬුවම් නොලබන පරිසරය තමවත් රජයමින් සිටී. හමුදාවන් විසින් සිදු කරනු ලබන අපයෝජනයන් පිළිබඳව කිසිදු පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව නොපෙනේ.

# ශ්‍රී ලංකාවේ විසංමුතිය මර්දනය - 2014 නොවැම්බර් - සිදුවීම් ලැයිස්තුව

| | සිදුවීම හටගත් දිනය | සිදුවීම හටගත් ප්‍රදේශය (දිස්ත්‍රික්කය) | සිදුවීමේ ස්වභාවය | මූලාශ්‍රය |
|---|---|---|---|---|
| **A. රජයට විරුද්ධ බව පෙනෙන පුද්ගලයන්ව ඝාතනය කිරීම, පැහැර ගෙනයාම සහ බිය ගැන්වීම** | | | | |
| 1 | නොවැම්බර් 20 | කොළඹ | අතුරලියේ රතන හිමියන්ගේ පන්සල වැටලයි | http://www.ft.lk/2014/11/21/athuraliye-rathana-theros-temple-surrounded/ |
| 2 | නොවැම්බර් 1 | නොච්චියාගම (අනුරාධපුර දිස්ත්‍රික්කය) | සිය අතුරුදහන් වූ සැමියා වෙනුවෙන් හඬ නගන කාන්තාව පැහැරගෙන යයි | http://srilankabrief.org/2014/11/mother-twins-wife-disappeared-abducted-threatened-abused-fighting-justice/#more-20985 |
| 3. | නොවැම්බර් 12 | මන්නාරම | දෙමළ ක්‍රියාකාරිකයෙකු ව තුවක්කු කරුවෙකු විසින් ඝාතනය කෙරේ | http://www.tamilguardian.com/article.asp?articleid=12834 |
| **B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්** | | | | |
| 4. | නොවැම්බර් 22 | කොළඹ | "සටන" දේශපාලන වැටසටහන අවහිර කෙරේ | http://www.colombopage.com/archive_14B/Nov22_1416678446CH.php |
| 5. | නොවැම්බර් 19 | යාපනය | උතුරේ තවත් ජන මාධ්‍ය පුහුණුවක් අවලංගු කෙරේ | http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=12024:military-shows-its-force-in-the-north-journalists-threatened&catid=150:lead-news&Itemid=113 |
| 6. | නොවැම්බර් 18 | යාපනය | යාපනය මාධ්‍ය සමාජය වෙත බුද්ධි අංශ නිළධාරීන් විසින් තර්ජනය කරයි | https://twitter.com/jaffnapressclub |
| 7. | නොවැම්බර් 7 | කොළඹ | සිය පක්ෂයේ පුවත් පත කොමියුනිස්ට් පක්ෂය විසින් වාරණය කෙරේ | http://archive.srilankamirror.com/news/17774-aththa-withdrawn-from-circulation-office-sealed |
| **C. දෙමළ සිහි කිරීම් වලට බාධා සහ තර්ජන** | | | | |
| 8. | නොවැම්බර් 25 | ත්‍රිකුණාමලය | ආගමික වතාවත් සඳහා පැමිණි බැතිමතුන්ව පලවා හැරේ | http://tamilnet.com/art.html?catid=13&artid=37521 |
| 9. | නොවැම්බර් 26 | කොළඹ | බුද්ධි අංශ විසින් උදයන් පුවත් පත පිළිබද පරීක්ෂණයක් ආරම්භ කෙරේ | http://www.tamilguardian.com/article.asp?articleid=12949 |
| 10. | නොවැම්බර් 25 | යාපනය | මහා වීර දිනයට අදාල පොස්ටර් ලග තබා ගැනිම හේතුවෙන් දෙමළ තරුනයෙකු අත්අඩංගුවට | http://www.tamilnet.com/art.html?catid=13&artid=37508 |



ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය
www.ihrdc.wordpress.com / informcolombo@gmail.com


| | | | | |
|---|---|---|---|---|
| 11. | නොවැම්බර් 7 | යාපනය | යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුවන්ගේ නම් ඇතුළත් තර්ජනාත්මක පෝස්ටර් | http://www.colombomirror.com/?p=1256 |
| 12. | නොවැම්බර් 27 | යාපනය | ආරක්ෂක අංශ විසින් *පරිත්‍යාගයේ සහන්* ඇවිලවූ ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තුවක් ලබා ගනී | http://tamilnet.com/art.html?catid=13&artid=37529 |
| 13 | නොවැම්බර් 25 | යාපනය | ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරනු බලන නිරීක්ෂණයන් තර කෙරේ | http://tamilnet.com/art.html?catid=13&artid=37507 |
| 14. | නොවැම්බර් 26 | යාපනය | විර දිනය සැමරීම සඳහා ඉඩ අහුරමින් යාපනය විශ්ව විද්‍යාලය වසා දැමීම | http://www.colombomirror.com/?p=1256 |
| 15. | නොවැම්බර් 26 | යාපනය | ආරක්ෂක හමුදා විසින් දෙමළ දේශපාලන පක්ෂයක කාර්යාලය වැටලීම | http://www.tamilguardian.com/article.asp?articleid=12950 |
| **D.** ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය | | | | |
| 16. | නොවැම්බර් 24 | | විශ්ව විද්‍යාල සිසුන්ගේ අත්සන් ව්‍යාපාරයට ප්‍රහාර | http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7851:banner-for-education-causes-namals-thugs-to-stampede-&catid=42:smartphones&Itemid=74 |
| **E.** විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය | | | | |
| 17 | නොවැම්බර් | උතුරු පළාත | රජයට සහය දක්වන ලෙස දෙමළ දේශපාලඥයන්ට බලපෑම් | http://tamilnet.com/art.html?catid=13&artid=37524 |
| 18. | නොවැම්බර් 21 | කොළඹ | විපක්ෂ දේශපාලන පක්ෂ වෙත මැතිවරණ පුවණ්ඩ ක්‍රියා එල්ල වීම | http://www.colombomirror.com/?p=1202 |



ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය
www.ihrdc.wordpress.com / informcolombo@gmail.com

## A. රජයට විරුද්ධ බව පෙනෙන පුද්ගලයන් ඝාතනය කිරීම, පැහැර ගෙනයාම සහ බිය ගැන්වීම

### 1. අතුරලියේ රතනහිමි වැඩවසන පන්සල වට කෙරේ



රාජයගිරියේ පිහිටි ජාතික හෙළ උරුමයේ නායක අතුරලියේ රතන හිමි වැඩ වසන පන්සල කුපිත වූ මැර කණ්ඩායමක් විසින් වට කිරීමෙන් අනතුරුව පොලීසිය විසින් පන්සල වටා ආරක්ෂාව තර කරන ලදී. මැර කණ්ඩායම විසින් පන්සල වට කළේ රතන හිමියන් විසින් රජයේ ඉඩමක් අනවසරෙන් භාවිත කරන බව චෝදනා කරමින්ය. මෙම සිදුවීම සිදු වූයේ ජාතික හෙළ උරුමය, තමන් පවතින සභාග ආණ්ඩුව යටතේ හොබවන අමාත්‍ය පදවි අත හරින බව ප්‍රකාශ කිරීමෙන් දින කිහිපයකින් අනතුරුවය. මෙම සිදුවීම ජනාධිපතිවරයාව බලෙයන් පහ කිරීම සඳහා සහය දැක්වන පුද්ගලයන් බිය වැද්දවීම සම්බන්ධ පළමු සිදුවීම ලෙස මැතිවරණ නිරීක්ෂකයන් පෙන්වා දී ඇත.

(අතුරලියේ රතන හිමි ඡායාරූපය - colombogazette)

http://www.ft.lk/2014/11/21/athuraliye-rathana-theros-temple-surrounded/ අවසන් පිවිසුම 29/12/14

### 2. සිය අතුරුදහන් වූ සැමියා වෙනුවෙන් හඬ නගන බිරිදව පැහැරගෙන යයි



පැහැරගෙන යාමෙන් පසු අතුරුදහන් වී සිටින සිය සැමියා වන මධුෂ්ක හැරිස් ද සිල්වා වෙනුවෙන් යුක්තිය සහ වගවීම ඉල්ලා සටන් කරන දෙදරු මවක් වන මයුරි ඉනෝකා ජයසිංහ මහත්මිය නොවැම්බර් 1 වන දින අනුරාධපුර නගරයේදී පැහැරගෙන ගොස් ඇත. මරණ තර්ජන එල්ල වීමෙන් පසුවද ඇය සිය සැමියා වෙනුවෙන් දිගින් දිගටම සටන් කළේය. පැරහගෙන ගිය පිරිස විසින් ඇයව කිලෝ මීටර් 30ක් පමණ දුරින් නොච්චියාගම ප්‍රදේශයේ දමා ගොස් ඇත. 'උඹ කතා කරනවා වැඩියි. ජීවත් වෙනවද මැරෙනවද කියන එක උඹම තීරණය කරපන්. ස්ටේජ් වල නැංගොත් උඹට වැඩි දුර යන්න අපි ඉඩ තියන්නේ නෑ. මනුස්සයා ගැන හොයන එක නවත්තපන්' යනුවෙන් පැහැරගෙන ගිය පිරිස විසින් ඇයට තර්ජනය කර ඇති බව වාර්තා විය. තමා මරා දැමුවොත් සිය දරුවන් දෙදෙනාට තුමක් සිදු වේවි දැයි තමා බිය වූ බව මයුරි මහත්මිය කියා සිටියේය. තමා පැහැර ගෙන ගිය පිරිස ආරක්ෂක හමුදාවන් මෙන් දිස් වූ බව ඇය තව දුරටත් කියා සිටියේය. නොච්චියාගම ප්‍රදේශයේ ඇයව අතහැර දමා ගොස් මිනිත්තු 10කින් පමණ එතැනට පොලීසිය ලගා වී ඇයව පොලීසිය කරා රැගෙන ගොස් ඇත. පොලීසිය විසින් තමාව ලිංගික වෘතිකාවක් ලෙස සලකමින් අසැබි වචනයෙන් බැණ වැදුණු බව ඇය බීබීසී සිංහල සේවය වෙත කියා සිටියේය.

http://srilankabrief.org/2014/11/mother-twins-wife-disappeared-abducted-threatened-abused-fighting-justice/#more-20985

අවසන් පිවිසුම 29/12/14

## 3. දෙමළ ක්‍රියාකාරිකයෙකු තුවක්කුකරුවකු විසින් ඝාතනය කෙරේ



නොවැම්බර් 12 වන දින රාත්‍රියේදී මන්නාරමේ වෙල්ලකුලන් ප්‍රදේශයේදී නාඳුනන තුවක්කුකරුවකු විසින් එල්.ටී.ටී.ඊ සංවිධානයේ පොලිස් අංශයේ හිටපු සාමාජිකයෙකුට වෙඩි තබා ඝාතනය කොට තිබුණි. මේසේ ඝාතනය කොට ඇත්තේ නගුලේෂ්වරන් ක්‍රිෂ්ණස්වාමි නැමති 34 හැවිරිදි පුද්ගලයෙකි. ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ පරීක්ෂණ සඳහා තොරතුරු ලබා දීම පිළිබඳව දෙමළ ජනතාව ධෛර්යමත් කළ බවට මොහු වෙත චෝදනා එල්ල වී තිබුණි. පුනරුත්තාපනය නොවුණු එල්.ටී.ටී.ඊ සාමාජිකයන් සහ ආධාරකරුවන් පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙසට හමුදා බුද්ධි අංශ විසින් නගුලේෂ්වරන් වෙත දන්වා තිබුණු බවත් බුද්ධි අංශ නිලධාරීන් හමු වීම මොහු ප්‍රතික්ෂේප කළ බවත් බව ප්‍රාදේශීය වාර්තාවක සඳහන් විය.

(නගුලේශ්වර්න් ක්‍රිෂ්ණසාමි ඡායාරූපය – Tamil Net)

http://www.tamilguardian.com/article.asp?articleid=12834 අවසන් පිවිසුම 29/12/14

# B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම

## 4. "සටන" දේශපාලන වැඩසටහන අවහිර කිරීම

නොවැම්බර් 22 වන දින පොදු විපක්ෂයේ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රථම රූපවාහිනී සාකච්ඡාව ශ්‍රී ලංකාවේ පෞද්ගලික රූපවාහිනී සේවා ප්‍රවර්ධකයින් විසින් අවහිර කරන ලදී. පියෝ ටීවී (Peo TV) ) කේබල් රූපවාහිනී ජාලය සහ ඩයලොග් ටීවී (Dialog TV) සැටලයිට් රූපවාහිනී ජාලය විසින් සිරස ටීවී නාලිකාව විසින් පොදු අපෙක්ෂකයා සහ විපක්ෂයේ තවත් සාමාජිකයන් කිහිප දෙනෙක් (හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න, ජාතික හෙළ උරුමයේ නායක අතුරලියේ රතන හිමි සහ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක) සමග පැවැත්වූ සටන දේශපාලන සාකච්ඡාව අවහිර කළ බව වාර්තා විය. මෙම වැඩසටහනෙ අන්තර්ජාලය ඔස්සේ සජීවීව විකාශය විය. පියෝ ටීවී (Peo TV) සහ ඩයලොග් ටීවී (Dialog TV) රූපවාහිනී ජාල මගින් MTV/MBC මාධ්‍ය ජාලයේ සියළුම නාලිකා අවහිර කර තිබුණි.

http://www.colombopage.com/archive_14B/Nov22_1416678446CH.php අවසන් පිවිසුම 29/12/14

## 5. උතුරේ තවත් ජන මාධ්‍ය පුහුණුවක් අවලංගු කෙරේ

උතුරු පළාතේ ජනමාධ්‍යවේදීන් වෙත ආරක්ෂ හමුදාවන් විසින් දිගින් දිගටම තර්ජනය කරන බව දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා ප්‍රකාශ කලේය. ඒ මහතා ප්‍රකාශ කළ ආකාරයට පසුගිය දින කිහිපය ඇතුළත ජනමාධ්‍යවේදීන් කිහිප දෙනෙක් වෙතම තර්ජන එල් වී ඇති අතර යාපනයේ ජීවත් වන එක් ජනමාධ්‍යවේදියෙක් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් හමුදාව විසින් ප්‍රශ්න කිරීම් වලට බඳුන් කර ඇත. මේ නිසා කංකසන්තුරෙහි දී පැවැත්වීමට සූදානම් කර තිබූ ජනමාධ්‍ය පුහුණු වැඩමුළුව අවලංගු කළ බව ඔහු තව දුරටත් ප්‍රකාශ කළේය.

http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=12024:military-shows-its-force-in-the-north-journalists-threatened&catid=150:lead-news&Itemid=113 අවසන් පිවිසුම 29/12/14

### 6. යාපනය පුවත් පත් සංසදය වෙත බුද්ධි අංශ නිළධාරීන් විසින් තර්ජනය කරයි

යාපනය පුවත්පත් සංසදය විසින් යවන ලද ට්වීටර් පණිවුඩයකට අනුව ජනතා විමුක්ති පෙරමුණ සඳහා ඉඩ ලබා නොදෙන ලෙස හමුදා බුද්ධි අංශ විසින් ඔවුන්ට තර්ජනය කර ඇත.

Jaffna Press Club @JaffnaPressClub · Nov 18 අවසන් පිවිසුම 29/12/14

#GOSL trying to stop us from traveling to North. Used intelligence personnel to threaten @JaffnapressClub not to host our Press Conf.#JVP

*ශ්‍රී ලංකා රජය අප උතුරුට යාම නැවැත්වීමට උත්සහ කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමට ඉඩ නොදෙන ලෙස යාපනය පුවත්පත් සංසදය වෙත බුද්ධි අංශ යොදා තර්ජනය කළා.* යනුවෙන් එම ට්විටර් පණිවුඩයේ සඳහන් විය.

### 7. සිය පක්ෂයේ පුවත් පත කොමියුනිස්ට් පක්ෂය විසින් වාරණය කෙරේ

පක්ෂයේ ඉහල නියෝගයක් අනුව නොවැම්බර් 7 වන දින කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයක් වන ඇත්ත පුවත්පත බෙදා හැරීම අවලංගු කර පුවත්පත් කාර්යාලයට සීල් තබන ලදී. ඇත්ත පුවත් පතෙහි කර්තෘත්වය දරන්නේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අංශයේ හිටපු ප්‍රධානියා වන ආචාර්ය මයිකල් ප්‍රනාන්දු විසිනි. පුවත් පතෙහි අන්තර්ජාල පිටපතද බලධාරීන් විසින් ඉවත් කර ඇති බව ආචාර්ය ප්‍රනාන්දු ෆේස්බුක්හි සටහන් කළේය. පක්ෂයේ අභ්‍යන්තර ආරවුල් පිළිබඳ වූ කටකතා තහවුරු කරමින් පළ වූ ලිපියක් මෙම සිදුවීමට හේතු වූ බව ඇත්ත පුවත් පතෙහි ජනමාධ්‍යවේදියෙකු උපුටා දක්වමින් අද දෙරණ වාර්තා කළේය.

http://archive.srilankamirror.com/news/17774-aththa-withdrawn-from-circulation-office-sealed අවසන් පිවිසුම 29/12/14

## C. දෙමළ සිහිකිරීම් වලට බාධා සහ තර්ජන

### 8. ආගමික වතාවත් සඳහා පැමිණි බැතිමතුන්ව පලවා හැරේ

නොවැම්බර් 25 වන දින ත්‍රිකුණාමලය බටහිර මුතූර් හි මුන්නම්පොළුවෙඩ්ඩයි ප්‍රදේශයේ පිහිටි පිල්ලෙයාර් හින්දු කෝවිල වෙත පැමිණි බැතිමතුන් හමුදා බුද්ධි අංශ විසින් පළවා හැර ඇත. මොවුන් පැමිණ සිටියේ දෙමළ (එල්.ටී.ටී.ඊ) වීරයන් සඳහා පූජා පැවැත්වීමට බව සිංහල හමුදා නිලධාරීහු චෝදනා කළහ. පූජාවන් සඳහා යොදා ගන්නා පොංගල් කිරිබත් පිසීමට බැතිමතුන් විසින් සකස් කරගෙන තිබුණු මුට්ටිය හමුදාව විසින් බිඳ දැමූ බව වාර්තා විය.

http://tamilnet.com/art.html?catid=13&artid=37521 අවසන් පිවිසුම 29/12/14

### 9. බුද්ධි අංශ විසින් උදයන් පුවත් පත පිළිබද පරීක්ෂණයක් ආරම්භ කෙරේ




බුද්ධි අංශ නිලධාරීන් විසින් උතුරේ ප්‍රධාන දෙමළ පුවත්පතක් වන උදයන් පුවත් පත පිළිබද පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. මෙම පරීක්ෂණය දියත් කරන ලද්දේ පුවත්පත විසින් එල්.ටී.ටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ජන්ම දිනය සමරා ඇති බවට චෝදනා කරමින් බව බීබීසී සිංහල සේවය වාර්තා කළේය. "දෙමළ ජනයාගේ නායකයාගේ 60 වන ජන්ම දිනය. ඉන්දියාවේ ප්‍රදර්ශනය කර තිබුණු අපගේ ජාතියේ දිව්‍ය පුත්‍රයා බිහි වූ මංගල දිනය" යන තේරුම ඇති වාක්‍ය ඇතුළත් පුවරුවක ඡායාරූපය සහිතව පුවත්පතේ පළවූ ලිපියක් මේ පරීක්ෂණයට හේතු වී ඇත.

(උදයන් පුවත්පතේ මුල් පිටුවෙහි ඡායාරූපය Tamil Guardian)


http://www.tamilguardian.com/article.asp?articleid=12949 අවසන් පිවිසුම 29/12/14

### 10. මහා වීර දිනයට අදාල පොස්ටර් ලග තබා ගැනීම හේතුවෙන් දෙමල තරුණයෙකු අත්අඩංගුවට

තෙන්මරච්චි හි මීසාලෛ ප්‍රදේශයේ තරුණ දෙමළ ක්‍රියාකාරිකයෙකු වන එස්. සුලක්සන්ගෙන් ත්‍රස්ත විමර්ශන අංශය ප්‍රශ්න කර ඇත. මහා වීර දිනය වෙනුවෙන් සකස් කළ පෝස්ටර් ලග තබා ගත් බවට චෝදනා එල්ල වී ඇති බව තෙන්මරච්චි පොලීසිය ප්‍රකාශ කළේය. නොවැම්බර් 25 වන දින මෝටර් සයිකලයකින් ගමන් කරමින් සිටි අවස්ථාවේ ආරක්ෂක හමුදාවන් විසින් මෙහු අත්අඩංගුවට ගෙන ඇත.

http://www.tamilnet.com/art.html?catid=13&artid=37508 අවසන් පිවිසුම 29/12/14

### 11. යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සහ ශිෂ්‍යයන්ගේ නම් ඇතුළත් තර්ජනාත්මක පෝස්ටර්



යාපනය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපති රාජ්කුමාර් මහතාගේ සහ තවත් ශිෂ්‍යයන් සිවු දෙනෙකුගේ නම් අතුළත් (නිවාස්, තමිල්සේල්වන්, අයින්කරන් සහ බ්‍රිටෝ) අතින් ලියන ලද මරණ තර්ජන සහිත පෝස්ටර් නොවැම්බර් 3 වන දින විශ්ව විද්‍යාලයට නුදුරු ස්ථානයක අලවා තිබුණි. එක් පොස්ටරයක *"නිවාස්, තමිල්සේල්වන්, අයින්කරන් සහ බ්‍රිටෝව අපි මරනවා"* යනුවෙන්ද *"උන් එල්.ටී.ටී.ඊ ය නැවත ගොඩගන්න හදනවා. අපි උඹලව මරනවා. වීරයන්ව සමරන්නට අපි ඉඩ තියන්නේ නෑ"* යනුවෙන්ද සදහන් විය. එල්.ටී.ටී.ඊ මහා වීර දිනය සෑම වසරකම නොවැම්බර් 27 වන දින සමරනු ලබයි. මහා වීර දිනය සැමරීම හේතුවෙන් අතීතයේදී ආරක්ෂක හමුදාවන් විසින් ශිෂයන්ට පහර දී ශිෂ්‍යයන් ගණනාවක්ම අත්තඩංගුවට ගෙන ඇත.

(අලවා තිබුණු එක් පෝසටරයක්; "උන් කොටින්ව ගොඩ ගන්න හදනවා. අපි උඹලට වෙඩි තියනවා" ඡායාරූපය - Tamil Guardian)

http://www.colombomirror.com/?p=1256 අවසන් පිවිසුම 29/12/14

## 12. ආරක්ෂක අංශ විසින් '*පරිත්‍යාගයේ දැල්ල*' ඇවිලවූ ශිෂ්‍යයන්ගේ නම් ලැයිස්තුවක් ලබා ගැනීම

නොවැම්බර් 27 වන දින විශ්ව විද්‍යාල භූමියේ සැරි සරන ශිෂ්‍යයන් සහ ආචාර්යවරුන්ගේ නම් ලැයිස්තුවක් ලබා දෙන ලෙස ත්‍රස්ත මර්දන ඒකකය විසින් යාපනය විශ්ව විද්‍යාලයේ ආරක්ෂක නිලධාරීන් වෙත නියෝග කර ඇති බව වාර්තා විය. මහා වීර දිනය සැමරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශිෂ්‍යයින් හඳුනා ගැනීම සඳහා සහයෝගය ලබා දෙන මෙන් විශ්ව විද්‍යාලය පරිපාලනයටද නියෝග කර ඇත. විශ්ව විද්‍යාල භූමියේ ඇති විනාශ වී ඇති වීරයන්ගේ සැමරුම් ස්මාරකය අසල එදින හමුදාව යොදවා තිබුණි. විශ්ව විද්‍යාලය නිරීක්ෂණය කිරීම සඳහා විශ්ව විද්‍යාලය අවට ඇති තට්ටු නිවාස සහ උස ගොඩනැගිලි තුළ හමුදාව රැඳී සිටියහ. කෙසේ වෙතත් ඇතැම් ශිෂ්‍යයින් විසින් පරිත්‍යාගයේ පහන් දල්වා ඇත. මහා වීර දිනයෙහිදී විශ්ව විද්‍යාලය අසල සැරි සැරූ වාහන ලේඛනයක් ආරක්ෂක හමුදාව සතුව ඇත. වාහන වල හිමිකරුවන් හඳුනා ගන්නා ලෙස විශ්ව විද්‍යාල ආරක්ෂක අංශ වලට නියම කර ඇති බව විශ්ව විද්‍යාල පරිපාලකයෙක් ටැමිල් නෙට් වෙත ප්‍රකාශ කළේය.

http://tamilnet.com/art.html?catid=13&artid=37529 අවසන් පිවිසුම 29/12/14

## 13. ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරනු බලන නිරීක්ෂණයන් තර කෙරේ



**යාපනෙය් හමුදා යෙදවීම ඉහල යාම; ඡායාරූපය – Tamil Net**

ආරක්ෂක අංශ විසින් මහා වීර දිනයට පෙර දෙමළ තරුණයන්, එල්.ටී.ටී.ඊයේ හිටපු සාමාජිකයන් සහ සිවිල් සමාජය තුළ බිය ඇති කිරීමට කටයුතු කරමින් සිටි බව ටැමිල් නෙට් වාර්තා කළේය. යාපනය විශ්ව විද්‍යාලය අසල පිහිටි නාච්චමාර් කොයියෙල් හි සහ කලාඩි හංදියේ නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් ආරක්ෂක අංශ විසින් ආරම්භ කර ඇත. මේ සඳහා මීටර් 500ක් ඇතුළත සහ කිලෝමීටරයක් දුරින් පිහිටා ඇති සිවිල් ජනයාගේ නිවාස යොදා ගෙන තිබුණි. නොවැම්බර් 27 වන දිනට යෙදී තිබුණි මහා වීර දිනය සැමරීම නවතා දැමීම මෙම බුද්ධි අංශ නිලධාරීන්ට පැවරී තිබුණු මූලික කාර්ය වූ බව වාර්තා විය.

http://tamilnet.com/art.html?catid=13&artid=37507 අවසන් පිවිසුම 29/12/14

### 14. විර දිනය සැමරීම සඳහා ඉඩ අහුරමින් යාපනය විශ්ව විද්‍යාලය වසා දැමීම

වීර දිනය සැමරීම වැළැක්වීම සඳහා හමුදා විහිදවීම ඉහළ දැමීමත්, විශ්ව විද්‍යාල ප්‍රජාව වෙත එල්ල වූ බලපෑම නිසාත් නොවැම්බර් 26 වන දින සිට දෙසැම්බර් 1 වන දින දක්වා යාපනය විශ්ව විද්‍යාලය වසා නිල වශයෙන් වසා තබන ලදී.

විශ්ව විද්‍යාලයේ ප්‍රධාන දෙරටු දෙකෙහි පාලනය ආයුධ රැගත් සිය ගණනක් වූ ආරක්ෂක හමුදා පාලනයට නතු කර ගත් බවත් යාපනයේ නේවාසිකාගාරවල සිටි සිසුන් ඇතුළු සියළුම ශිෂ්‍යයන් විශ්ව විද්‍යාලයෙන් ඉවත් කිරීමට නියෝග කළ බවත් මාධ්‍ය වාර්තා කළේය. හමුදාව විසින් ඔවුන්ගේ මුර සංචාර සහ පරීක්ෂා කිරීම් ද ඉහල දමා තිබුණි.

http://www.colombomirror.com/?p=1256 අවසන් පිවිසුම 29/12/14

### 15. ආරක්ෂක හමුදා විසින් දෙමල දේශපාලන පක්ෂයක කාර්යාලය වැටලීම

ආරක්ෂක හමුදාව විසින් නොවැම්බර් 26 වන දින සවස 4.00 ට පමණ දෙමළ ජාතික ජනතා පෙරමුණේ කාර්යාලය වැටලූ බව එම පක්ෂය ප්‍රකාශ කළේය. එල්.ටී.ටී.ඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ ජන්ම දිනය ට පෙර දින ආරක්ෂක හමුදා නිරීක්ෂණ ආරම්භ වූ බවත් කාර්යාලයේ දොරටුව අසල බුද්ධි අංශ නිළධාරීන් ස්ථාන ගත කර සිටි බවත් විශාල හමුදා සහභාගිත්වයක් පවතින නිසා නිවැසියන් නිවෙස් අත්හැර යාමට බියෙන් පසු වූ බවත් එම පක්ෂය ප්‍රකාශ කළේය.

http://www.tamilguardian.com/article.asp?articleid=12950 අවසන් පිවිසුම 29/12/14

## D. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

### 16. විශ්ව විද්‍යාල සිසුන්ගේ අත්සන් ව්‍යාපාරයට ප්‍රහාර

පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති පුත්‍ර නාමල් රාජපක්ෂ නායකත්වය දරන නිල් බලකාය තරුණ දේශපාලන ව්‍යාපාරය විසින් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට විරුද්ධව අත්සන් ව්‍යාපාරයක නිරත වූ අන්තර් විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ ශිෂ්‍යයන් වෙත පහර දී ඇති බව වාර්තා විය. මෙම අත්සන් ව්‍යපාර සඳහා විශාල ජන සහයෝගයක් තිබුණු බව මාධ්‍ය වාර්තා කළේය. නගර ගණනාවකදී එල්ල වූ ප්‍රහාර නොතකා අත්සන් ව්‍යාපාරය දිවයිනේ නගර කිහිපයක දීම දියත් විය.

http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7851:banner-for-education-causes-namals-thugs-to-stampede-&catid=42:smartphones&Itemid=74 අවසන් පිවිසුම 29/12/14

## E. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

### 17. දෙමළ දේශපාලන පක්ෂ සාමාජිකයෙකුට පක්ෂය මාරු කරන ලෙස රජයෙන් තර්ජන

ආරක්ෂ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ සෘජු අණ යටතේ ක්‍රියා කරන “බුද්ධි අංශ සහ දේශපාලන නිලධාරීන් ” විසින් නගර සභාවේ සිටින බිම් මට්ටමේ දෙමළ නියෝජිතයන් රජය වෙත නම්මවා ගැනීමට ප්‍රයත්න දරමින් සිටි බව ටැමිල් නෙට් වාර්තා කළේය. කොළඹ සිටින දෙමළ නියෝජිතයන් ලවා දෙමළ ජාතික සන්ධානයේ නගර සභා සභාපති සහ උතුරු පළාත් සභාවේ නියෝජ්‍ය සභාපති ආණ්ඩු පක්ෂය වෙත හරවා ගැනීමට උත්සහ දරන බව යාපනයේ තතු දන්නා මූලාශ්‍රයක් සඳහන් කළේය. හිටපු එල.ටී.ටී.ඊ සාමාජිකයෙකු වන දැනට ආරක්ෂ හමුදා භාරයේ සිටින සිය පුත්‍රයා නිදහස් කර ගැනීම අවශ්‍ය නම් පක්ෂය මාරු කරන ලෙස උතුරේ එක් නාගරික මන්ත්‍රීවරයෙකුට දන්වා ඇත.

http://tamilnet.com/art.html?catid=13&artid=37524 අවසන් පිවිසුම 29/12/14

## 18. විපක්ෂ දේශපාලන පක්ෂ  වලට විරුද්ධ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා



චමිල රණසිංහ ඉතා අසාධ්‍ය තත්ත්වයක පසු විය - ඡායාරූපය – SriLanka Brief

පොදු විපක්ෂයෙන් ජනාධිපති අපේක්ෂකයා ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා ඉදිරිපත් වන බව ප්‍රකාශ කර පැය කිහිපයකට පසු රථ පෙළපාලියකදී ඇති වූ ගැටුමකදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිල රණසිංහ මහතාගේ හිසට වෙඩි ප්‍රහාරයක් එල්ල විය. පළවූ වාර්තා වලට අනුව කාර් රථයකින් පැමිණි නාදුනන පිරිසක් විසින් බේරුවෙල ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක වන රණසිංහ මහතාට වෙඩි තබා ඇත. මේ වෙඩි තැබීම සිදුවී ඇත්තේ පායගල, මග්ගොන ප්‍රදේශයේ දී විපක්ෂ ආධාකරුවන් පිරිසක් විසින් සිකුරාදා සවස මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පක්ෂ මාරුව සමරමින් සිටි අවස්ථාවකද බව එම වාර්තා තව දුරටත් සඳහන් කළේය. .

http://www.colombomirror.com/?p=1202 අවසන් පිවිසුම 29/12/14